මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.11.29

# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකාව ණය ප්‍රතිකර්මය සම්බන්ධ නිල ණය හිමි කමිටුව (Official Creditor Committee On Debt Treatment) සමඟ ගිවිසුමකට එළැඹේ

ණය ප්‍රතිකර්ම මූල්‍ය කොන්දේසි සම්බන්ධයෙන් එහි නිල ණය හිමි කමිටුව (OCC) සමඟ ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවකට පැමිණ ඇති බව ශ්‍රී ලංකා රජය විසින් සතුටින් දැනුම් දෙනු ලැබේ. මෙම ගිවිසුම ප්‍රතිපත්තිමය වශයෙන් දළ වශයෙන් ඩොලර් බිලියන 5.9 ක හිඟ රාජ්‍ය ණය ආවරණය කරනු ලබන අතර දිගු කාලීන කල්පිරීමේ දිගුවකින් (long-term maturity extension) සහ පොලී අනුපාත අඩු කිරීමේ සංකලනයකින් සමන්විත වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැඩසටහන් ඉලක්කවලට අනුකූලව රාජ්‍ය ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අන්‍යෝන්‍ය කැපවීමක් පෙන්නුම් කරනු ලබන මෙම ගිවිසුමට එළඹීමේදී OCC සාමාජිකයින් දක්වන ලද අනුග්‍රහය සහ සහයෝගය ශ්‍රී ලංකා රජය විසින් අගය කරනු ලබයි. මෙම ගිවිසුම මගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාවට සහය දක්වනු ලබන වැඩසටහනේ පළමු සමාලෝචනය සඳහා IMF විධායක මණ්ඩලයේ කඩිනම් අනුමැතිය ලබා ගැනීමට පහසුකම් සැලසෙන අතර, IMF මූල්‍යකරණයේ මීළඟ වාරිකය ලෙස ලබා දීමට නියමිත ඩොලර් මිලියන 334 ලබා දීමට ඉඩ සලසනු ලබයි.

එකඟ වූ ණය ප්‍රතිකර්ම කොන්දේසි ශ්‍රී ලංකාව සහ OCC අතර අවබෝධතා ගිවිසුමකින් තවදුරටත් විස්තර කර විධිමත් කෙරෙනු ලබන අතර, එක් එක් OCC සාමාජිකයා සමඟ ඔවුන්ගේ නීති සහ රෙගුලාසිවලට අනුකූලව ද්විපාර්ශ්වික ගිවිසුම් හරහා එය ක්‍රියාත්මක කෙරේ. එකඟ වූ කොන්දේසි කඩිනමින් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂාවෙන් පසු වේ.

භාණ්ඩාගාර/ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් කේ. එම්. මහින්ද සිරිවර්ධන මහතා විසින් පහත ප්‍රකාශය සිදු කරන ලදී.

*"මෙම ගිවිසුම ශ්‍රී ලංකාව සඳහා සුවිශේෂී පියවරක් සනිටුහන් කරනු ලබයි. අප රටෙහි රාජ්‍ය ණය තත්ත්වය විසඳීම සඳහා ලබා දෙන්නා වූ නොසැලෙන සහයෝගය වෙනුවෙන් OCC සහ එහි සම සභාපතිවරුන් වන ජපානය, ඉන්දියාව සහ ප්‍රංශය වෙත අපගේ අවංක ස්තූතිය පිරිනමමු. රාජ්‍ය ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීමට සහ ආර්ථික ප්‍රකෘතිමත් බව සඳහා වන අඛණ්ඩ ප්‍රයත්නයන් හිදී මෙම ගිවිසුම ප්‍රධාන සන්ධිස්ථානයක් ලෙස ක්‍රියා කරනු ලබයි."*

මෙම ගිවිසුම ප්‍රතිපත්තිමය වශයෙන්, China Exim bank සමඟ පසුගිය මස ඇති කර ගත් ප්‍රතිපත්තිමය එකඟතාව ද සමඟ, ශ්‍රී ලංකාවේ බාහිර ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී බොහෝ දුරක් ගමන් කරනු ඇත. සමස්තයක් ලෙස තවත් ඩොලර් මිලියන 274ක හිඟ හිමිකම් ප්‍රමාණයක් නියෝජනය කරමින් සෞදි අරාබිය, පකිස්ථානය, කුවේට් සහ ඉරානය ඇතුළු අපගේ සෙසු නිල ද්විපාර්ශ්වික ණය හිමියන් සමඟ සමාන ගිවිසුම් අවසන් කිරීම මීළඟ පියවරවලට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාව බාහිර වාණිජ ණය හිමියන් සමඟ සහ විශේෂයෙන්ම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් සමඟ සැසඳිය හැකි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම්වලට එළඹීමේ ප්‍රයත්න සඳහා යොමු වීමට අදහස් කරයි. ඒ සම්බන්ධයෙන් සද්භාවයෙන් කටයුතු කිරීම් තවමත් සිදු වෙමින් පවතින අතර හැකි ඉක්මනින් අන්‍යොන්‍ය වශයෙන් පිළිගත හැකි එකඟතාවකට පැමිණීමේ අරමුණින් සාකච්ඡා කඩිනම් කරන ලෙස එකී බැඳුම්කර හිමියන්ට ආරාධනා කිරීමට බලධාරීන් අපේක්ෂාවෙන් පසු වේ.

විනිවිදභාවය, සහභාගී වන සියලු ම බාහිර ණය හිමියන්ට සංසන්දනාත්මකව සැලකීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් සහය දක්වනු ලබන වැඩසටහන යටතේ ණය තිරසාර ඉලක්කවලට පූර්ණ ලෙස අනුකූල වීම සඳහා තම කැපවීම නැවත තහවුරු කිරීමට බලධාරීන් කැමැත්තෙන් පසු වේ.